(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 125.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 සැප්තැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0686/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 සැප්තැම්බර් 01 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව මගින් වෙන්දේසි කරනලද ශ්‍රී ලංකා රජයේ රන් සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) එසේ වෙන්දේසි කරන ලද රත්තරන්වල වටිනාකම එක්සත් ජනපද ඩොලර්වලින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජය විසින් රත්තරන් මිලදී ගැනීමට ගෙවූ මිල ගණන් කවරේද;

(iv) රාජසන්තක කරනලද රත්තරන් ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ රන් සංචිතවලට එක් කරනු ලැබුවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයට අයත් රත්තරන් ප්‍රමාණයක් පසුගිය වසර දෙක තුළ විකුණනු ලැබුවේද;

(ii) එසේ නම්, එම රත්තරන්වල අලෙවි මිල කවරේද;

(iii) එම රත්තරන් විකිණීම ටෙන්ඩර් කැඳවීමක් හෝ වෙන්දේසි කිරීමක් මගින් සිදුකරන ලද්දේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0985/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ත්‍රිකුණාමලය වරායේ ප්‍රයෝජනයට ගත හැකි යකඩ තොගයක් 2010 සැප්තැම්බර් මස මුල් කාලයේ දී ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව විකුණා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම යකඩ තොගය මිලදීගත් ආයතනය හෝ පුද්ගලයා කවරුන්ද;

(ii) එම යකඩවල බර ප්‍රමාණය කොපමණද;

(iii) එම යකඩ අලෙවියෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලැබුණු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අලෙවිකරන ලද ඉහත යකඩ තොගය ඉවත් කරගැනීමේදී වරායට පිවිසීමේදී හා පිටවීමේදී ක්‍රියාත්මක කරන පිළිගත් ක්‍රමවේදයට අනුකූලව ක්‍රියාකර තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළ ලියවිලි ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මෙම ගණුදෙනුවේ දී මූල්‍යා වංචාවක් සිදු වී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේ නම්, එයට සම්බන්ධ වූ අයට එරෙහිව ගන්නා ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1160/'11

3\.
ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ 2005 සිට 2010 දක්වා කාල සීමාව තුළ කුරුඳු වගා කරන ලද බිම් ප්‍රමාණය කොපමණද;

(ii) කුරුඳු අලුතින් වගා කිරීම සඳහා සහ නැවත වගා කිරීම සඳහා හෙක්ටයාර එකකට දෙනු ලබන සහනාධාර මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දැනට කුරුඳු වගාකරුවන් සඳහා ලබාදෙන සහනාධාර මුදල ප්‍රමාණවත් වන්නේද;

(ii) නොඑසේ නම්, එම සහනාධාර මුදල වැඩි කිරීම සඳහා 2011 අය වැය මගින් ප්‍රතිපදාන වෙන් කර තිබේද;

(iii) ඒ සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1218/'11

4\.
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1536/’11

5.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නුවරඑළිය දිස්ත්‍රික්කයේ, මස්කෙළිය නගරයේ ඇති කාණු පද්ධතිය වර්ෂ 40කට වඩා පැරණි බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කිසිදු අලුත්වැඩියාවක් සිදු නොකිරීම නිසා අබලන්ව ඇති මෙම කාණු පද්ධතියෙන් අපවිත්‍ර ජලය පිටතට උතුරා යෑමෙන් පැතිරීයන දුර්ගන්ධය හේතුවෙන් අවට පදිංචි ජනතාව මහත් අපහසුතාවයන්ට පත්වන බවත්;

(ii) එම තත්ත්වය ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යයට මහත් තර්ජනයක්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මාඋස්සාකැලේ ජලාශය ඉදිකිරීමේදි ජලයෙන් යටවූ මස්කෙළිය පැරණි නගරය වෙනුවට වර්ෂ 1968 දී ඉදිකළ මස්කෙළිය නව නගරයේ ඇති මෙම කාණු පද්ධතියේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන ලෙස අදාළ නිලධාරීන්ට, පළාත් පාලන ආයතනවලට හා පළාත් සභාවට නියෝග කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1628/’11

6.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2002 සිට මේ දක්වා අධ්‍යාපන විද්‍යා පීඨවලින් පිට වූ ගුරුවරුන්ගෙන් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි නමුත්, දැනට උතුරු මැද පළාතේ සේවය කරන ගුරුවරු සංඛ්‍යාව එක් එක් විෂයය අනුව කොපමණද;

(ii) එම ගුරුවරුන්ට උතුරු මැද පළාතෙන් නිදහස්වී තම පදිංචි ප්‍රදේශවලට ස්ථාන මාරු ලබා ගැනීම සඳහා ඔවුන් වෙනුවෙන් වෙනත් ගුරුවරුන් එම පළාතට යෙදවීම සම්බන්ධයෙන් අවධානය යොමු කොට තිබේද;

(iii) දුෂ්කර සේවය නිම කළ ඉහත සඳහන් ගුරුවරුන්ගේ සාධාරණ ඉල්ලීම් සලකා බලා ලබා දී ඇති ස්ථාන මාරුවීම් සංඛ්‍යාව කොපමණද;

(iv) එවැනි ඉල්ලීම් මත ස්ථානමාරු ලබා නොදුන් ගුරුවරුන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය කර ඇති මැදිහත්වීම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0691/’10

7.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ වූ දින සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු පිහිටුවීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම එක් එක් බැංකුවේ ප්‍රධාන ශාඛාව යටතේ ක්‍රියාත්මක වන බැංකු ශාඛා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත බැංකුවල ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය කොපමණද;

(iv) අද වන විට වාණිජ බැංකුවලට අවශ්‍ය වන කොටස් ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත බැංකු අතරින් ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ තිබෙන කවර හෝ බැංකුවක් විදේශීය බැංකුවක් මිලදී ගැනීමට මුදල් ගෙවා තිබේද;

(ii) එසේ නම්, එම බැංකුවේ නම සහ එම බැංකුව මගින් අනුමත කර ඇති මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වාණිජ නොවන බැංකු සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන වාණිජ නොවන බැංකු සංඛ්‍යාව කවරේද;

(iii) එම බැංකුවල කොටස් ප්‍රාග්ධනය කොපමණද;

(iv) යම්කිසි වාණිජ හෝ වාණිජ නොවන බැංකුවක් බංකොළොත් තත්ත්වයට පත්වී තිබේද;

(v) එසේ නම්, එම බැංකුවල සහ ඒවායේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0986/'10

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති පොත් ප්‍රකාශන ඒකකයෙන් 2010 වර්ෂයේදී නිකුත් කර ඇති ග්‍රන්ථ කවරේද;

(ii) ඒ අතරින් අ.පො.ස. උසස් පෙළ භූගෝල විද්‍යා විෂයයට අදාළව නිකුත්කර ඇති ග්‍රන්ථ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ග්‍රන්ථ අතර, අදාළ විෂය නිර්දේශය පාසල්වලින් ඉවත්කළ පසු නිකුත් කර ඇති ග්‍රන්ථ තිබේද;

(iv) එසේ නම්, එම ග්‍රන්ථයේ හෝ ග්‍රන්ථවල නම් කවරේද;

(v) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1220/'11

9.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1273/'11

10\.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද කදුරුවාන තේ කම්හල වර්ෂ හයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා ඇති බවත්;

(ii) ජාතික සම්පතක් වන එම කර්මාන්ත ශාලාව ප්‍රයෝජනයට නොගෙන අත්හැර තිබීමෙන් ජාතික ආර්ථිකයට විශාල පාඩුවක් සිදු වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තේ කම්හල ඉදිකිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(ii) එය ප්‍රයෝජනයට නොගෙන අත්හැර දමා තිබීමට හේතු කවරේද;

(iii) තේ කම්හලේ නිෂ්පාදන කටයුතු කඩිනමින් ආරම්භ කොට ප්‍රදේශයේ තේ වගාකරුවන්ගේ අමු තේ දළු මිලදී ගැනීමේ ක්‍රමවේදයක් සකසන්නේද;

(iv) නිෂ්පාදන කටයුතු ආරම්භ කරන්නේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1630/'11

11\.

ගරු අනුර දිසානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංගමයට බදු පදනම යටතේ ගෙවීම සඳහා මිලදී ගත් මුළු බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ ගෙන්වා ඇති දිනයන් හා එක් එක් දිනයේදී ගෙන්වා ඇති බස් රථ සංඛ්‍යාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගෙන්වන ලද එක් බස් රථයක මිල කොපමණද;

(ii) මාසිකව එක් බස් රථයක් වෙනුවෙන් ගෙවිය යුතු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) බදු පදනම මත ඉහත බස්රථ මිලදී ගැනීමේදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1221/'11

12\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1277/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාතේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඌරාමුල සහ නැගෙනහිර පළාතේ, පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දොරකුඹුර අතර මාර්ගයේ දොරකුඹුර පාලම නමින් යකඩ පාලමක් ඇති බවත්;

(ii) වර්ෂ ගණනාවක් තිස්සේ දිරාපත්ව, අබලන්ව ඇති එම පාලමෙහි යකඩ වැටද මේ වන විට කැඩී ගොස් ඇති බවත්;

(iii) එම තත්ත්වය හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව තම ගමනාගමන කටයුතුවලදී දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තත්ත්වය මගහැරවීම සඳහා කඩිනමින් පාලම ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1307/'11

14.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා දරන මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා මිල කොපමණද;

(iii) ගොඩනැගිලිවල බදු කාලය කොපමණද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) අයත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබාගන්නා අනෙකුත් සේවා කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවා සඳහා පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබාගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළඹි පුද්ගල සංඛ්‍යාව කොපමණද;

(vi) සමස්ත කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

යන්න මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට අදාළව ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1342/'11

15.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවිනැගුම වැඩ සටහන යටතේ ලබා දෙන රෝපණ මල්ලේ වටිනාකම කොපමණද;

(ii) එම රෝපණ මල්ලේ අඩංගු ද්‍රව්‍ය හා ඒවායේ ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දිවිනැගුම වැඩ සටහන සඳහා එක් ග්‍රාම නිලධාරී වසමකින් සහභාගි කර ගන්නා පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් ග්‍රාම නිලධාරී වසමක් සඳහා මේ වන විට වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ජාතික පොලිස් අභ්‍යාස ආයතනය,— ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පිහිටුවීම සඳහා ද; ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අරමුණු හා කර්තව්‍ය හඳුනා ගැනීම සඳහා ද; එම අභ්‍යාස ආයතනයේ කළමනාකරණය සහ පරිපාලනය සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත

*1.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*4.

වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*6.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*7.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*13.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*14.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරී පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*15.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*16.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

19.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**